# ලොව නන්දෙසින් වාර්තා වන භූ චලන

ආර්.එම්. ටී. බී. රත්නායක

**ස්වභාව ධර්මයාගේ නොඉවසිලිමත් විපිරියාස සහ සැඩපරුෂ බව පෙන්වීමේදී මිනිසාට දේපළවලට ගහකොළ සහ සතා සීපාවාට සිදුවන ව්‍යසනයන් දරුණු ය. කෲර ය මේ හානිදායක සිදුවීම් අතර භූමිකම්පා, කුනාටු, සුළි සුළං, ධාරානිපාත වර්ෂා, ගංවතුර , නාය යෑම්, දරුණු නියඟය යනාදීන් කැපී පෙනෙයි. ඇස්ට්‍රොයිඩ පොළොව මත ගැටීම් නිසා ලෝක විනාශයක් ද අතළඟ ම බවට තවත් විද්වත් පිරිසක් අනතුරු අඟවති.**

2001 ජනවාරි 26 දා ඉන්දීය ජනරජ උත්සව දිනයේ දී බටහිර ඉන්දියාවේ ගුජරාට ප්‍රාන්තයේ සිදු වූ මහා භූ චලනයෙන් ඇති වූ විපත් හදවත් කම්පා කරවන සුළු ය. එම භූමිකම්පාවේ භයානකත්වය රිච්ටර් මාපක 7.5 ක් වීම තවත් තීව්‍ර කර තිබිණි. ඉන්දියාවට භූමිකම්පා අලුත් දෙයක් නොවන වග හෙළි කළ හැක්කේ 1737, 1935, 1993, 1997 වැනි වර්ෂ වලදී ද සිදු වී ඇති නිසා ය. පසුගිය වර්ෂයේ ජනවාරි 26 දා ගුජරාටයේ සිදුවූ භූමිකම්පාවෙන් පසු තවත් පුවතක් වාර්තා වුයේ මධ්‍යම ආසියාවේ රටවල් කිපයකට දනෙන අයුරිනි. රිච්ටර් මාපක 6.7 ක භූ චලනයක් වූ එය සිදු වී ඇත්තේ 2001 පෙබරවාරි 26 දා ය. 2001 පෙබරවාරියේ චීනයේ භූමිකම්පාවක් සිදු වී තිබේ. 2001 ජූලි 16 ද දකුණු චීනයේ ගුවැංකේසි ප්‍රදේශයේ රන් ආකාරයක් තුළට ගංවතුර ගැලීම නිසා ආකර කම්කරුවන් 200 කට අධික පිරිසක් මිය ගිය බව වාර්තා වී තිබිණි. 2001 පෙබරවාරි 26 දා සිදුවූ භූමිකම්පාවෙන් ඇෆ්ගනිස්ථානයේ කාබුල් නගරයේ සිට ඉන්දියාවේ නවදිල්ලි නගරය දක්වා සිටි ජනතාව භීතියට පත්ව තම නිවෙස් වලින් පැන වීත් විදි පුරා එක්රොක් වූහ. මෙම භූ චලනය පාකිස්ථානය, තජිකිස්ථානය, උස්බෙකිස්ථානය, ඇෆ්ගනිස්ථානය වැනි රටවලට දනී ඇති බව නවදිල්ලි "හින්දු" පුවත්පත වාර්තා කර තිබිණි.

2001 පෙබරවාරි සති අන්තයේ චීනයේ කඳුකර ගම්මානවල සිටි තිබ්බත ජාතිකයන්ට සිදුවූ භූමිකම්පාවෙන් දැඩි සීතල ගතිය, ආහාර අහේනිය, අනාථ බව, සෞඛ්‍ය තර්ජන වැනි අභාග්‍ය සම්පන්න තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වූ වග වාර්තා වී තිබුණි.

2001 ජනවාරි 26 ද ගුජරාට් ප්‍රාන්තයේ සිදුවූ භූ චලනයන් 30,000 කට අධික පිරිසක් යත එත මං නැති විය. මිය ගියහ. තුවාල ලැබූවන්ගේ ගණන 33,000 කට අධික විය. සුන්බුන්වලට යට වූ මිය ගියවුන්ගේ මළ සිරුරුවලින් හමා ආ දුගඳ විශාලා මහනුවර , එද සිදුවූ ව්‍යසනය සිහිපත් කරවිය. 1997 මැයි 23 ද ඉන්දියාවේ මධ්‍යම ප්‍රදේශයේ ජබාල්පූර් හි දී සිදුවූ භූමිකම්පාවෙන් එක් ගම්මානයක 40 ක් පමණ මියගොස් 1000 කට වැඩි පිරිසක් තුවාල ලැබුවෝ ය. ඇතැම් ගෙවල් කඩා වැටීම නිසා ඒවා තුළ නිදා හුන් අය පණ පිටින් වැළලී ගිය බව ද පැවසේ. 1993 සැප්තැම්බර් මාසයේදී මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ සිදුවූ භූ චලනයකින් ද ඉන්දියාවේ 10,000 කට අධික පිරිසක් මිය ගියහ.

පීරු රටේ දක්ෂිණ ප්‍රදේශයේ භූමිකම්පාවකින් 50 ක් පමණ මිය ගොස් 600කට වඩා බරපතල තුවාල සිදුවූ වගක් පසු ගිය වර්ෂයේ ජූනි මාසයේ දී වාර්තා විය. මීට ඉහතදීත් 1970 දී සිදු වූ මහා භූ කම්පාවෙන් එරට වැසියන් 70,000 ක් මිය ගිය අතර ලක්ෂ 6 කට පමණ උන්හිටි තැන් අහිමි විය.

1999.07.17 ද තුර්කියේ බටහිර ප්‍රදේශයේ හටගත් භූමිකම්පාවෙන් ද 700 කට ආසන්න පිරිසක් මිය ගියහ. පසුගිය වර්ෂයේ මාර්තු 1 ද සැල්වදෝරයේ ද භූමිකම්පාවක් සිදු වී තිබේ. බටහිර ජපානයේ සිදුවූ භූමිකම්පාවකින් (හිරෝෂිමා නගරාසන්න වෙරළ ආශ්‍රිත ප්‍රදේශයේ) පසුගිය වර්ෂයේ මාර්තු මාසයේ දී සිදු වූ හානියෙන් කිප දෙනෙකු මරණයට පත්ව ඇතැයි ද 60 දෙනකු පමණ තුවාල ලැබූ වග ද හෙළි වී තිබේ. උතුරු ජපානයේ ද එම මාසයේ ම එවන් භූමිකම්පාවක් සිදු විය.

ලොව ආසියාතික රටවලට මෙන් ම සෙසු රටවලට ද භූචලන අලුත් දෙයක් නොවේ. අප රටට භූ චලන බියක් මුලින් ම වාර්තා වුයේ 1614 අප්‍රේල් 14 දා ය. පෘතුගීසි යුගයේ දී කොළඹ කොටුවේ ඇති වූ මෙම භූ කම්පනයෙන් 2000 ක් පමණ දෙනා මිය ගිය බවත් නිවාස 500ක් පමණ විනාශ වූ බවත් ඉතිහාසය කියයි. ශ්‍රී ලංකාවේ යළි භූ චලනයක් ගැන වාර්තා වූ යේ 1999 නොවැම්බර් 15 වැනිද ය. කොළඹ සහ මහනුවර සුළු වශයෙන් මෙම භූ කම්පනය සිදු වී තිබේ. බම්බලපිටිය, කොළඹ සරසවිය, හා බේරේවැව ආශ්‍රිත ප්‍රදේශවල මෙය සිදු වී තිබේ. කොළඹ නගරයේ සමහර තට්ටු ගොඩනැගිලි ගෘහ භාණ්ඩ මහනුවර දියාපති කාර්යාලය පිහිටි ප්‍රදේශය ද චලනය වූ බව වාර්තා විය. 1999 නොවැම්බර් 15 ද දියතලාව ප්‍රදේශයේ දී ද සාමාන්‍ය භූ චලනයක් සිදුව තිබේ. මේවායින් ජීවිත හානි සිදුවූ වගක් අනාවරණය නොවී ය. ශ්‍රී ලංකාවේ නිරිතදිග කලාපයේ ඇතැම් ප්‍රදේශවල ද 2001 .09.02 ද භූ චලනයක් සිදු වී තිබේ. පෙරවරු 8.30 ට පමණ සිදුවූ මෙම චලනයෙන් කළුතර, පානදුර, මොරටුව, කඩවත, බොරලැස්ගමුව, මතුගම, දොඩන්ගොඩ වැනි ප්‍රදේශවලට හොඳින් දනී තිබේ.

අප රටේ සිදුවන භූමි කම්පා පරීක්ෂා කිරීමට අවශ්‍ය උපකරණ 1999 වර්ෂය තෙක් නොතිබිණි. පල්ලෙකැලේ භූමිකම්පා මාපකයක් සවි කර ඇතත් මේවායින් නිසි ප්‍රයෝජන ලබා ගන්නේ දැයි සැකයකි.

ඇතැම් විද්වත්හු කොත්මලේ, වික්ටෝරියා, රන්දෙනිගල වැනි ජලාශ්‍රිත ප්‍රදේශවල භූචලන ඇති විය හැකි බවට අනුමාන කරති. එසේ වුවහොත් ලංකාවට විදුලිය සැපයීමේ තර්ජනයක් ඇතිවනු ඇත.

ස්වභාව ධර්මයට අනුව භූ චලන කවද කොයි අවස්ථාවේ සිදුවේ දැයි නිගමනය කිරීම අපහසු ය. නවීන තාක්ෂණික විද්‍යාවේ මහිමයෙන් භූ චලන සිදු වන අයුරු හා දින වකවානු පිළිබඳ තොරතුරු හෙළි කර ගැනීමට හැකි වුවහොත් යම් තරමකට හෝ සිදුවන ආපදාවන්ගෙන් බේරීමට ඉඩකඩ සලස්වා ගත හැකි ය. ❑